[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/fy;tp mikr;R - gpupntdhf;fs; fy;tpg; gpupT

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

| 01 | S | I |
|---|---|---|

## 01 ශ්‍රේණිය

## (01) සිංහල

පැය දෙකයි.

**පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 100කට නොඅඩු රචනයක් ලියන්න.

i. ගස්වැල් අපේ මිතුරෝ ය.
ii. වෙසක් පොහෝ දින අපේ පන්සල.
iii. මම සමනලයෙක් වෙමි.
iv. වැසි දිනයක්.
v. ගුණ නුවණින් පිරි අපේ සඟ පරපුර.

(ලකුණු 25)

02. (අ). සිංහල හෝඩියේ සඳහන් සඤ්ඤක අකුරු ලියා දක්වන්න.

(ලකුණු 05)

(ආ). දීර්ඝ ස්වර අක්ෂර 04ක් ලියන්න .

(ලකුණු 05)

(ඇ). පහත දැක්වෙන වචනවල පිල්ලම් නම් කරන්න.

i. කේතලය  ii. කැරලා
iii. කෞතුක  iv. ගොඩ  v. මාතර

(ලකුණු 05)

03. (අ). පහත දැක්වෙන වචන අකාරාදි පිළිවෙළට ලියන්න.

කෝච්චිය, නිදහස, ඇතා, ඉතාලිය, තෙරුවන්

(ලකුණු 05)

(ආ). පහත දැක්වෙන ඒකවචන පද බහුවචනයට හරවන්න.

ගොවියා, සේවකයා, ළමයා, සිංහයා, සෙබළා

(ලකුණු 05)

(ඇ). පහත සඳහන් පුරුෂ ලිංග නාම පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.

ගුරුවරයා, මල්ලී, භික්ෂුව, ඇතා, කපුටා

(ලකුණු 05)

04. (අ). පහත සඳහන් වචන උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ යනුවෙන් වර්ග කර දක්වන්න.

තෝ, මම, ඔවුහු, නුඹලා, අපි

(ලකුණු 05)

(ආ). පහත දැක්වෙන නාම පද ප්‍රාණවාචී හා අප්‍රාණවාචී ලෙස වර්ග කර ලියන්න.

පුටුව, අම්මා, කෝච්චිය, ළමයා, තරුව  (ලකුණු 05)

(ඇ). පහත දැක්වෙන නාම පද පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග යන වර්ග තුනට බෙදා දක්වන්න.

ගස, මල්ලී, භික්ෂුව, ගුරුතුමිය, තරුව

(ලකුණු 05)

05. (අ). පහත දැක්වෙන ක්‍රියා පද ඒකවචන, බහුවචන ලෙස වර්ග කර දක්වන්න.

නටයි, ලියති, කියයි, වඩිති, අසති

(ලකුණු 05)

(ආ). පහත දැක්වෙන ක්‍රියා පද ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ, යනුවෙන් බෙදා දක්වන්න.

රකිමි, ලියහි, රකිති, රකිහු, ලියහු

(ලකුණු 05)

(ඇ). පහත දැක්වෙන ක්‍රියා පද අතීත කාල, වර්තමාන කාල, අනාගත කාල ලෙස වර්ග කර දක්වන්න.

ඇවිදියි, මතු ඇවිදියි, ඇවිද්දේය, ලිව්වේය, හෙට ලියයි

(ලකුණු 05)

06. (අ). නම් පොතෙහි සඳහන් පහත දැක්වෙන නම්වලට අදාළ අකුර යොදා සම්පූර්ණ කරන්න.

i. පුසු ..... පිටිය    ii. කා ..... යගම    iii. ..... දිගම
iv. ක ..... කාව    v. බමු ..... ගම

(ලකුණු 05)

(ආ). මඟුල් ලකුණ පොතේ සඳහන් මඟුල් ලකුණු යුගල පහක් නම් කරන්න.

(ලකුණු 05)

(ඇ). පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

i. ළමයි ක්‍රීඩා ................ (කරති/කරයි)
ii. ඔවුහු පාසල් ............... (ගියහ/ගියේය )
iii. අම්මා ගීත ගායනා ............. (කළේය/කළාය)
iv. මම මල් පූජා ............ (කළෙමි/කළෙමු)
v. නුඹලා බෝධි පූජා ........... (කළෙහු/කරති)

(ලකුණු 05)

07. (අ). ලෝවැඩ සඟරාව රචනා කළ සාහිත්‍ය යුගය නම් කරන්න.

(ලකුණු 05)

(ආ). ලෝවැඩ සඟරාවේ දැක්වෙන පහත සඳහන් කවි සම්පූර්ණ කර ලියන්න.

''කාලා රස මුසු බෝජන කර පෙම්''
''ගඟ යන ඇත්කුණ ඉඳ මස් රසටා''

**(ලකුණු 10)**

08. (අ). කුමාරතුංග මුනිදාස මහතා රචනා කළ **හීන්සැරය** ළමා කෘතිය හැර එතුමා විසින් රචිත තවත් ළමා කෘති දෙකක් නම් කරන්න.

**(ලකුණු 05)**

(ආ). හීන්සැරය ළමා කෘතියේ පළමු පරිච්ඡේදයේ **ගෝන හාමී හා කටුසු හාමී** අතර වූ කතාව සරලව විස්තර කරන්න.

**(ලකුණු 10)**

* * *